සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
**Sabaragamuwa Provincial Department of Education**

| | | |
|---|---|---|
| **පළමු වාර පරීක්ෂණය** | **2018** | **8 ශ්‍රේණිය** |
| **முதலாம் தவணைப் பரீட்சை** | **2018** | **தரம் 8** |
| **First Term Test** | **2018** | **Grade 8** |

| | |
|---|---|
| ***දේශීය නර්තනය – I,II*** | ***පැය 2 යි*** |
| ***Dancing - I,II*** | ***2 hours*** |

නම/විභාග අංකය :- ..............................................................................................

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(1) නර්තනයේ මූලික අංගහාරය වන්නේ ,
i. මණ්ඩියයි. ii. කස්තිරමයි. iii. පා සරඹයි iv. දණ්ඩියමයි.

(2) පිළිවෙලින් උඩරට පහතරට සබරගමු නර්තන ශිල්පීන් වන්නේ,
i. පොල්වත්තේ ගෝමිස් , පී.ඊ. සේදරමන් , රද්දෑල්ලේ පොඩි මහත්තයා.
ii. පී.වී.හීන්නිලමේ ,පී.ඊ. සේදරමන් , පොල්වත්තේ ගෝමිස්
iii. පී.ඊ. සේදරමන් , පොල්වත්තේ ගෝමිස් , රද්දෑල්ලේ පොඩි මහත්තයා.
iv. රද්දෑල්ලේ පොඩි මහත්තයා , පී.වී.හීන්නිලමේ , පී.ඊ. සේදරමන්.

(3) හිසේ සිට දෙපතුල දක්වා පමණක් දෝෂ දුරුවීම සඳහා ගයනු ලබන්නේ ,
i. මල් යහන් කවි. ii. තාලම් කවි iii.ආශිර්වාද කවි. iv. සිරසපාද කවි.

(4) සබරගමු වන්නමක ප්‍රධාන කොටස් ,
i. 4 කි. ii. 6 කි. iii. 5 කි. iv. 3 කි.

(5) පහතරට නර්තන සම්ප්‍රදායේ ඉලංගම් සරඹ නටා අවසන් කරනු ලබන්නේ,
i. කස්තිරමෙනි. ii. ඉරට්ටියෙනි. iii. හමාර පදයෙනි. iv. අඩව්වෙනි.

❖ **ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා ප්‍රශ්නවලට අදාල නිවැරදි පිළිතුර හිස් තැන් මත ලියන්න.**

(6) වන්නමක් ආරම්භ වන්නේ ..............................................................................................

(7) තාලම්පටින් නිකුත්වන ධ්වනි ගණන.............................................................................................. කි.

(8) නර්තනයේ ත්‍රිවිධ ලය .............................................................................................. නමින් හැඳින්වේ.

(9) ...................................................... හා .............................................................. ද්විධ ගැමි නැටුම් 2 කි.

(10) තුරඟා වන්නම නටනු ලබන්නේ ........................................................................................ දෙතිතටයි.

➢ ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යා කරන්න.

| | |
|---|---|
| (11) වෙස් ඇඳුම් කට්ටලය. | දවුල |
| (12) මණ්ඩියේ ප්‍රමාණය | කස්තිරමකි. |
| (13) දොං ජිංත ගත දොංත | උඩරට |
| (14) සබරගමු නැටුම | මිටි රියනකි. |
| (15) තත් ජිත් තොං නං තා | බෙරපදයකි. |

➢ ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට හරිනම් ( √ ) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද වරහන් තුළ යොදන්න.

(16) නම්‍යතා අභ්‍යාසවල යෙදීමෙන් ශරීරයේ අංග, ප්‍රත්‍යාංග, උපාංග නිවැරදිව හැසිරවීමේ හැකියාව ඇති වේ. (............)

(17) විලම්භ ලය යනු ඉතා වේගයෙන් නර්තනය කිරීමයි. (............)

(18) සත්ව චරිත නිරූපණයේ දී එම සතුන්ගේ චර්යා ලක්ෂණ පිළිබඳ අවබෝධය අවශ්‍ය නැත. (............)

(19) සිදුහත් කුමරුගේ අභිනිෂ්ක්‍රමණය පිළිබඳ තුරඟා වන්නමෙන් කියවේ. (............)

(20) කතරගම දේවාල පෙරහැරේ ද්‍රවිඩ ගැමි නැටුම් වැඩි වශයෙන් දක්නට ලැබේ. (............)

(ලකුණු 1 x20 = 20)

## II - කොටස

❖ පළමු ප්‍රශ්නය අනිවාර්ය වන අතර තවත් ප්‍රශ්න 2 ක් තෝරා පිළිතුරු ලියන්න.

01. (i) ''උත්සාහය'' නැමති ස්ථායි භාවයෙන් ........................................................................ රසය උපදී.

(ii) පහතරට වන්නම් ගණනින් ........................................................................................ කි.

(iii) සබරගමු නර්තන ශිල්පියෙකුපාද හුරුකර ගැනීම සඳහා ............................................ පද නටනු ලබයි.

(iv) මහ තනි තිතට අයත් මාත්‍රා ගණන ................................................................................ කි.

(v) වෛරොඩි වන්නම නර්තනය කරනු ලබන්නේ................................................................ තිතටයි.

( 2 X 5 = 10)

(02) (i) ඔබ උගත් නර්තන සම්ප්‍රදායේ ශාන්තිකර්මයක උපත් කතාව කෙටියෙන් ලියන්න. (ලකුණු 4)

(ii) එම ශාන්ති කර්මයේ නර්තන අංග තුනක් හා චාරිත්‍ර විධි තුනක් නම් කරන්න. (ලකුණු 6)

(03) (i) තනි තිතේ ප්‍රභේද නම් කරන්න. (ලකුණු 3)

(ii) මාත්‍රා තුන තනි තිතට අදාළ වන්නමක කවියක් ලියන්න. (ලකුණු 3)

(iii) මාත්‍රා තුන තනි තිතට අදාළ බෙර පදයක් ප්‍රස්ථාර කරන්න. (ලකුණු 4)

(04) (i) ඔබ දන්නා ගැමි නැටුම් 06 ක් නම් කරන්න. (ලකුණු 4)

(ii) ගැමි නැටුමක දක්නට ලැබෙන ලක්ෂණ 03 ක් ලියන්න. (ලකුණු 3)

(iii) ඉන් ඔබ කැමති ගැමි නැටුම් දෙකකට අදාළ කවි දෙකක් ලියන්න. (ලකුණු 4)